කාර්ය සාධන වාර්තාව

2019

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

ඇමුණුම I

2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 245

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම:

රටෙහි ආර්ථිකයට ක්ෂණික බලපෑම් ඇති කරන ආකාරයෙන් රාජ්‍ය සම්පත් එනම් රාජ්‍ය ආදායම සහ වියදම කළමනාකරණය කරන ආකාරය, රාජ්‍ය මුදල් කළමනාකරණය විෂය හා සම්බන්ධ වේ. සාමාජීය අවශ්‍යතා රජය සතුව පවතින සම්පත් වලට වඩා වැඩි බැවින්, ආර්ථික හානි හා අපතේ යාම් අවම වන ආකාරයෙන් සියලුම රාජ්‍ය සම්පත් හැකිතාක් කාර්යක්ෂමව හා සඵලදායීව භාවිතා කිරීම අවශ්‍ය වේ. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී රජය සහ පුරවැසියන් අතර අන්‍යොන්‍ය විශ්වාසයක් හා පොදු එකඟතාවක් ඇති කිරීමෙහි ලා කාර්යක්ෂම රාජ්‍ය මුදල් කළමනාකරණය කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරයි. රජයේ මුදල් වල විනිවිදභාවය සහ වගවීම තහවුරු කරමින් සහ රටේ පුරවැසියන් සඳහා වඩාත් හොඳ සේවාවක් ලබා දෙමින් දිගුකාලීන ආර්ථික සාර්ථකත්වය සහතික කිරීම සඳහාත්, සීමිත සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කිරීම සඳහාත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද, ක්‍රියාවලි සහ ආයතනවල ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍ය වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“රාජ්‍ය අංශයේ විනිවිදභාවය, වගවීම, හා සේවා සැපයීම වර්ධනය කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති පද්ධති රාමුවක් සකස් කිරීම”

මෙහෙවර

“රාජ්‍ය අංශය තුල මහජන වගවීමට සහාය වන ආයතනික ක්‍රියාකාරීත්වයක් සහිත පුළුල් යහපාලන පරිසරයක් ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය පද්ධති, පරිපාටීන් සකස්කිරීම, සමාලෝචනය, සංවර්ධනය, පසුවිපරම හා යාවත්කාලීන කිරීම.”

අරමුණු

1.රාජ්‍ය අංශයේ ගණුදෙනුවල විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම පිණිස රාජ්‍ය මුල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති, ක්‍රමපද්ධති හා පරිපාටීන් සැකසීම, සංවර්ධනය, සමාලෝචනය, පසුවිපරම සහ යාවත්කාලීන කිරීම. (උදා: මුදල් රෙගුලාසි, රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ භාවිතයන්)

2. රාජ්‍ය මුල්‍ය සම්පත් ඵලදායිව සහ කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහතික කරනු පිණිස රාජ්‍ය ගිණුම් කාරක සභාවට අවශ්‍ය සහාය ලබා දීම සහ රාජ්‍ය අංශයේ යහපාලනය ප්‍රවර්ධනය කිරීම.

3. දැනට පවතින රජයේ ගාස්තු හා අයකිරීම් කටයුතු අධීක්ෂණය, සමාලෝචනය කිරීම සහ පිරිවැය ඵලදායීතාව ඉහළ නංවන අයුරින් බද්ද නොවන ආදායම් ඉපැයීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම.

4. මහජන මුදල් ඵලදායිව සහ කාර්යක්ෂම ලෙස යෙදවීම සහතික කරනු පිණිස, විවිධ අරමුණු උදෙසා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පිහිටුවා ඇති අරමුදල් භාවිතය විධිමත් කිරීම, අරමුදල් කටයුතු සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුව මගින් ඉටු කරන සේවා කඩිනම් කිරීම පිණිස 2018 ජුලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජකාරී ව්‍යුහය සංශෝධනය කර ඇත. ඒ අනුව ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි සියලුම අමාත්‍යාංශ පහත දක්වා ඇති ආකාරයට පුළුල් ක්ෂේත්‍ර වලට වෙන් කර ඇති අතර ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සියලුම නිලධාරීන්ට පවරා ඇත.

අ) ප්‍රාදේශීය සංවර්ධනය

ආ) පාලනය

ඇ) පරිසරය

ඈ) ආරක්ෂාව

ඉ) යටිතල පහසුකම්

ඊ) විදේශ රැකියා

උ) ආගමික හා සංස්කෘතික කටයුතු

ඌ) ප්‍රාථමික කර්මාන්ත

ඔ) සමාජ සුභසාධනය

ඕ) සෞඛ්‍ය

ක) කර්මාන්ත

ග) ඉඩම්

ච) අධ්‍යාපනය

ජ) තරුණ කටයුතු

ට) විශේෂ ගෙවීම් ඒකක

මූල්‍ය ක්‍රම පද්ධති අංශය

- මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් යෝජනා සමාලෝචනය කිරීම හා අර්ථකථනය සැපයීම.
- නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (PFM) පනත හා රෙගුලාසි වලට අදාළ කාර්යයන් ඉටු කිරීම.
- රාජ්‍ය ආයතන (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන) පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමෙහිලා රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහය වීම.
- විගණකාධිපති වාර්තාව පරීක්ෂා කිරීම හා පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම
- රාජ්‍ය ගිණුම් කාරක සභා විසින් නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- පාර්ලිමේන්තු සැසිවාරයන්හි රාජ්‍ය ගිණුම්කාරක සභා වාර්තා මත පදනම් වෙමින් භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම.
- මුදල් රෙගුලාසි 202 යටතේ කරුණා සහගත ගෙවීම් සඳහා කරනු ලබන ඉල්ලීම් සමාලෝචනය කිරීම හා අදාළ පුද්ගලයින් දැනුවත් කිරීම.
- රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ ගැටළු සමාලෝචනය කිරීම.
- රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දැනට පවතින ගාස්තු හා අයකිරීම් පිළිබඳ දත්ත හා තොරතුරු එක්රැස් කිරීම, ගැලපීම හා බෙදා හැරීම.
- රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දැනට පවතින ගාස්තු හා අයකිරීම් ප්‍රතිශෝධනය කිරීම සඳහා වන යෝජනා නිර්දේශ නිකුත් කිරීම.
- මුදල් රෙගුලාසි යටතේ රජයේ පාඩු කපා හැරීමේ හා අත්හැර දැමීමේ ඉල්ලීම් අධ්‍යයනය කිරීම හා නිර්දේශ කිරීම.

අරමුදල් අංශය

- ව්‍යවස්ථාපිත, භාරකාර හා දෙපාර්තමේන්තු අරමුදල් වලට අදාළ මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.
- අරමුදල් සමාලෝචන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.
- වාර්ෂික ගිණුම් හා විගණකාධිපති වාර්තා පරීක්ෂා කිරීම හා අරමුදල් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අරමුදල් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- ව්‍යවස්ථාපති නොවන අරමුදල් විධිමත් කිරීම.

ප්‍රසම්පාදන අංශය

- ප්‍රසම්පාදනය සම්බන්ධ කරුණු අධ්‍යනය කිරීම හා නිර්දේශ සැපයීම.
- රජයේ නියෝජිතායතනවල ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීමේ අරමුණින් ප්‍රසම්පාදනය සම්බන්ධ ගැටළු පිළිබඳ පැහැදිලි කිරීම් සම්පාදනය කිරීම හා නිකුත් කිරීම.
- ප්‍රසම්පාදන තීරණ ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කමිටු (CAPC) ,තාක්ෂණික ඇගයීම් කමිටු (TEC), හා ව්‍යාපෘති කමිටු (PC), පත් කිරීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වයන්හට පහසුකරණය සැලසීම.
- ප්‍රසම්පාදන නිවේදන, උසස් ප්‍රසම්පාදන නිවේදන, ප්‍රසම්පාදන සැලසුම් හා කොන්ත්‍රාත් ප්‍රදානයන් අන්තර් ජාලයට මුදා හැරීම.
- විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-Gp) පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයේදී ජාතික ප්‍රසම්පාදන කොමිසම (NPC) වෙත සහාය වීම.

ප්‍රසම්පාදනය සම්බන්ධ කරුණු, මූල්‍ය රෙගුලාසි, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් (PPP) හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ගරු මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ කෙටුම්පත් කිරීම.

1.4. සංවිධාන සටහන

ආයතනික සංවිධාන ව්‍යුහය



අ.ජ–අධ්‍යක්ෂ ජනරාල්	අති.අ.ජ – අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	අ – අධ්‍යක්ෂ
ස.අ- සහකාර අධ්‍යක්ෂ	ප.නි – පරිපාලන නිලධාරි	ස.නි– සංවර්ධන නිලධාරි
සැ.ස-සැළසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර	කළ.ස- කළමණාකරන සහකාර	භා.ප– භාෂා පරිවර්ථක
කා.කා.ස - කාර්යාල කාර්ය සහායක	රි.සේ- රියදුරු සේවය	

1.5. අමාත්‍යංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

මූල්‍ය ක්‍රම පද්ධති අංශය

අරමුදල් අංශය

ප්‍රසම්පාදන අංශය

1.6. අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතෙ පවතින ආයතන/ අරමුදල්

- අදාල නොවේ -

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

-අදාල නොවේ -

02 පරිච්ඡේදය – ප්‍රගතිය ඉදිරි දැක්ම

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ මූල්‍ය පාලනය සම්බන්ධ මධ්‍යගත කාර්යභාරයක් ඉටු කරන අතර රාජ්‍ය අංශයේ ආයතන වල මූල්‍ය පාලනය සඳහා වන විධිවිධාන වලට අනුකූල වීම, විනිවිදභාවය, ස්ථාවර බව, වගවීම හා සේවා ලබා දීම වර්ධනය කරන වඩාත් යහපත් වූ රාජ්‍ය මූල්‍ය නියාමන රාමුවක් පවත්වා ගැනීම සඳහා 2019 වසර තුල සාධනීය දායකත්වයක් සපයා ඇත.

02. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (COPA) මෙහෙය වීමෙන් රජයේ ආයතන වල පොදු ගිණුම් තැබීමේ ක්‍රම, මූල්‍ය පාලනය හා කාර්ය සාධනය පරිගණක ජාලගත ක්‍රමය මඟින් වාර්ෂිකව ඇගයෙන අතර ඉහළ කාර්ය සාධන මට්ටමක් ලබා ගත් ආයතන සඳහා වන සම්මානය 2017 සහ 2018 වර්ෂවලදී ලබාගැනීමට හැකිවීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ලද සුවිශේෂී ජයග්‍රහණයක් වේ.

03. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 ව්‍යවස්ථාව හා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 119 ප්‍රකාරව පිහිටුවා ඇති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 2019 වර්ෂයේ රැස්වීම් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වෙමින් කාරක සභාවට අවශ්‍ය සහය ලබාදෙන ලදි. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවේ සඳහන් නිර්දේශ මත රාජ්‍ය ආයතන වල ප්‍රශස්ත මූල්‍ය කලමනාකරණයක් පවත්වා ගැනීම සඳහා මු.රෙ.153 විධිවිධාන පරිදි භාණ්ඩාගාර සටහන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ නිකුත් කර ඇත. තවද රාජ්‍ය ආයතන වලට අදාලව විගණකාධිපති වරයා විසින් නිකුත් කරන විගණන විමසුම් හා විගණන වාර්තා පිළිබඳව අවධානය යොමු කොට රාජ්‍ය මූල්‍ය කලමනාකරණයේ දුර්වලතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඒ ඒ

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට හා ගණන් දීමේ නිලධාරීන්ට දන්වමින් පසු විපරම් කටයුතු 2019 වර්ෂයේ සිදු කර ඇත.

04. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(1) ව්‍යවස්ථාව හා මු.රෙ.124(2) විධිවිධාන පරිදි අමාත්‍යාංශ ලේකම්වරුන් තම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස කටයුතු කලයුතු අතර 2019 වර්ෂය තුල අමාත්‍යාංශ ලේකම්වරු 30 දෙනෙකු සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස පත්කරමින් ඊට අදාළ පත්වීම් ලිපි භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ අත්සනින් නිකුත් කිරීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදි.

05. 2018 හා 2019 වර්ෂ වල අයවැය යෝජනා මඟින් වර්ෂ 03 කට වරක් ගාස්තු සංශෝධනය කරන ලෙස ලබා දුන් උපදෙස් අනුව ක්‍රියාත්මක වීමට අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් රජයේ ආයතන වලට දන්වමින් එම ආයතන වලින් සංශෝධනය කිරීමට ඉදිරිපත් කරන ලද ගාස්තු වර්ග 20ක් සඳහා සංශෝධනයට අවශ්‍ය භාණ්ඩාගාර අනුමැතිය 2019 වර්ෂයේදි ලබා දී ඇත.

06. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රජයේ ආයතන විසින් 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 3 වන කොටසෙහි පාඩු හා අත්හැර දැමීම් යටතේ කටයුතු කිරීමෙන් අනතුරුව මු.රෙ.108 (3) යටතේ කපාහැරීම සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලද අවස්ථා සහ මු.රෙ.113 යටතේ අත්හැරීමට යොමු කරන ලද අවස්ථා සඳහා 2019 වර්ෂයේ අමාත්‍යාංශ 10 කට අදාළ ඉල්ලීම් අනුව අවශ්‍ය භාණ්ඩාගාර අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත.

07. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2/92 දරණ රාජ්‍ය දූත මණ්ඩල චක්‍රලේඛයේ විධිවිධාන පරිදි රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය කිරීමේදී රජයට ගෙවිය යුතු තීරුබදු මුදල පිළිබඳ කටයුතු කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර 2019 වර්ෂයේදී විදේශ දූත මණ්ඩල විසින් අපහරණය කරන ලද වාහන 34 ක් සඳහා වූ අදායම ලෙස රු. 45, 603, 991.00 ක මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශය මගින් රාජ්‍ය ආදායමට බැර කොට ඇත.

08. විවිධ විෂයන් යටතේ ගරු අමාත්‍යවරුන් විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ගරු මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දීම මුදල් අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2019 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන, රජයේ විවිධ අරමුදල්, මුදල් රෙගුලාසි හෝ රාජ්‍ය මුදල් කලමනාකරණ විෂයන්ට සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ හා නිර්දේශයන් ලබා දීම සිදු කරන අතර, 2019 වර්ෂය තුල අමාත්‍ය මණ්ඩල සංදේශ 948ක් සඳහා නිරීක්ෂණද, අමාත්‍ය මණ්ඩල සංදේශ 173ක් සඳහා නිර්දේශ ද ලබා දී ඇත.

09. ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ප්‍රසම්පාදන කමිටු (SCAPC) 17 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ප්‍රසම්පාදන කමිටු (CAPC) 56 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා සම්මුති කමිටු (CANC) 32 ක් ද, ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා සම්මුති කමිටු (SCANC) 02 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන උපදේශන ප්‍රසම්පාදන කමිටු (CACPC) 20 ක් ද, ව්‍යාපෘති කමිටු (PC) 20 ක් ද, තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) 158 ක් හා විශේෂ කමිටු 03 ක් ද ලෙස සමස්ථ කමිටු 337 ක් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින්2019 වර්ෂය තුලදී පත්කිරීම් සිදුකර ඇත.

10. 2019 වර්ෂය තුලදී මුදල් රෙගුලාසි, අරමුදල් කලමනාකරණය හා ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන චක්‍රලේඛ 12 ක් නිකුත් කර ඇත. එසේම, පිරිවැය සමාලෝචන කමිටුව (CERC) පිහිටුවීම, විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ද්වාරය (eGP Portal) එළිදැක්වීම, 2016 වර්ෂයේ සිට කටයුතු කරමින් පැවති නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතක් සඳහා සකස් කල කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම යනාදිය 2019 වර්ෂය තුල කටයුතු කරනු ලැබූ විශේෂ වූ කාර්යයන් වේ.

11. නව තාක්ෂණය යටතේ මූල්‍ය කළමනාකරණයට අදාල කාර්යයන් තවදුරටත් විධිමත් කරමින් වර්තමානයට ගැලපෙන පරිදි, කාලානුරූපීව රාජ්‍ය මූල්‍ය කලමනාකරණය සම්බන්ධයෙන් වූ විධිවිධාන යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම හා හැකිතාක් දුරට විද්‍යුත් ක්‍රමවේද අනුගමනය කරමින් එදිනෙදා රාජකාරි කටයුතු ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම ඉදිරි වර්ෂ වලදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ක්‍රියාමාර්ගයන් වේ.

ජේ.සී.වැලිඅමගේ

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	සත්‍ය 2019	සත්‍ය 2018	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		81,602,000	89,858,091	ඒසීඒ-3
-	තැන්පතු		20,604	41,557	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,773,924	5,564,448	ඒසීඒ-5
-	වෙනත් ලැබීම්		2,807,561	2,743,204	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**90,204,089**	**98,207,299**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**90,204,089**	**98,207,299**	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		**0**		
53,550,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	51,271,094	47,812,458	ඒසීඒ-2(ii)
20,540,200	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	18,748,908	18,027,741	ඒසීඒ-2(ii)
1,200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	892,175	868,878	ඒසීඒ-2(ii)
0	පොලී ගෙවීම්	8	0	0	ඒසීඒ-2(ii)
0	වෙනත් පුනරාවර්තන වියදම්	9		15,922,800	ඒසීඒ-2(ii)
75,290,200	මුළු පුනරාවර්තන වියදම් (ඇ)		**70,912,177**	**82,631,877**	
	මූලධන වියදම්				
4,214,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	3,213,876	3,593,272	ඒසීඒ-2(ii)
6,822,800	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,860,309	10,100,214	ඒසීඒ-2(ii)
0	ප්‍රාග්ධන මාරුකිරීම්	12	0	0	ඒසීඒ-2(ii)
0	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	0	0	ඒසීඒ-2(ii)
4,000,000	හැකියා වර්ධනය	14	1,188,267	92,950,675	ඒසීඒ-2(ii)
25,500,000	වෙනත් මූලධන වියදම්	15	5,790,491	757,674	ඒසීඒ-2(ii)
40,536,800	මුළු මූලධන වියදම් (ඉ)		**12,052,943**	**107,401,835**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**5,966,712**	**7,318,524**	
	තැන්පතු ගෙවීම්		20,604	41,557	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		5,946,108	7,276,966	ඒසීඒ-5
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		88,931,832	197,352,237	
115,827,000	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**1,272,257**	**(9,914,4937)**	

1

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	2019	2018
		රු.	රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	35,058,542	35,052,636
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	12,584,017	12,411,833
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	0	0
මුළු වත්කම්		**47,642,559**	**47,464,470**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		12,584,017	12,411,833
දේපළ පිරියත හා උපකරණ සංචිතය		35,058,542	35,052,636
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5/5(බී)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4		-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	0	0
මුළු වගකීම්		**47,642,559**	**47,464,470**

පිටු අංක 05 සිට 40 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 41 සිට 49 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එස්.ආර්.ආටිගල	නම : ජේ.සී.වැලිගමගේ	නම : ඩී.එන්.එස්.වැලිකල
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	
දිනය : 2020.02. 24	දිනය : 2020.02. 18	දිනය : 2020.02. 17

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ
මහලේකම් කාර්යාලය
කොළඹ 01

ජේ.සී. වැලිගමගේ
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඩී. එන්. සුභාෂිණී වැලිකල
අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සතහ 2019 රු.	2018 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	2,807,561	
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		
අග්‍රිම ලැබීම්	81,602,000	88.819.143
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**84,409,561**	**88,819,143**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	69,719,612	64.718.471
සහනාධාර සහ මාරුකිරීම්	892,175	868.878
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	300,000	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,045,734	436.066
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**71,957,521**	**66,023,416**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**12,452,039**	**22,795,727**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	
ලාභාංශ	-	
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	
උපණය අයකර ගැනීම්	-	
අත්තිකාරම් අයකර ගැනීම්	3,380,940	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**3,380,940**	
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	12,052,943	22.795.727
අත්තිකාරම් ගෙවීම්	3,780,037	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**15,832,980**	**22,795,727**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(12,452,039)**	**(22,795,727)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0.00**	**0.00**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0.00**	**0.00**

NATIONAL AUDIT OFFICE

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 **ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.7 **වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	72,660,000	75,290,200	70,912,177	94.2%
ප්‍රාග්ධන	13,400,000	40,536,800	12,052,943	29.7%

3.8 **මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		අදාල නොවේ				

3.9 **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	35,058,542	35,058,542	-	100%
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	ටීආර්ඩී/සී/ඩීපීඑෆ්/2019/එෆ්ඒ/03	ඔබේ අංකය / உமது இல. / Your No.		දිනය / திகதி / Date	2020 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 අක් මුදල් ගැලැපුම් ගිණුම

විගණනයට ඉදිරිපත් කර තිබුණු අක් මුදල් ගැලැපුම් ගිණුමේ බැර පැත්තේ එකතුව ලෙස රු 2,466,461.ක් දක්වා තිබු එහි එකතුව රු 2,692,984.ක් විය යුතුව තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය වත්කම්

2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට අදාළ ශේෂය රු.1,045,734 ක් වී තිබුණි. එම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1 මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

සමාලෝචිත වර්ෂයේදී තැන්පතු ලැබීම් රු.20,604 ක් හා තැන්පතු ගෙවීම් රු.20,604 ක් සිදු කර තිබුණත්, එම ලැබීම් හා ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

2.1.1 නිෂ්ඵල වූ ප්‍රතිපාදන

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.400,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකර එම ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

2.1.2 අධි ප්‍රතිපාදන සලසා ගැනීම

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 04 ක් සඳහා රු.මිලියන 35.39 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.මිලියන 27.43 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25.65 ක සිට සියයට 98.23 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

2.2 බැරකම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයයන් 06 ක් යටතේ එකතුව රු.322,461.39 ක බැරකම්වලට එළඹ තිබුණි. 2017 අප්‍රේල් 27 දිනැති අංක 155/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ 02(ඈ) ඡේදය ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාළ සියළුම බැරකම් එම වර්ෂ තුළදී නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අපේක්ෂාව ඇතිව ඉදිරියට ගෙන නොයා යුතුය. එම උපදෙස්වලට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් බැරකම්වලට එළඹ තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එස්.එම්.ඩී.එස්. සුදිෂ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	**අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම**		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
නව මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත			√
උපදෙස් ලබා දීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ නිකුත් කිරීම	√		
දෙපාර්තමේන්තුව වෙත යොමු කල පැහැදිලි කිරීම් සඳහා පිලිතුරු සැපයීම	√		
සහභාගී වූ රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් සංඛ්‍යාව	√		
ගිණුම්කාරක සභාවේ මග පෙන්වීම් පසු විපරම් කිරීම	√		
භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම	√		
විගණකාධිපති වාර්තා නිරීක්ෂණ සම්බන්ධව පසු විපරම් කටයුතු	√		
රජයේ ගාස්තු හා අයකිරීම් සංශෝධනය	√		
පාඩු හා කපා හැරීම් සඳහා වන ඉල්ලීම් සඳහා නිර්දේශ සැපයීම	√		

රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය	√		
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම	√		
කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු (PC) ,තාක්ෂණික ඇගයීම් කමිටු (TEC), හා ව්‍යාපෘති කමිටු (PC), පත් කිරීම	√		
විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන කාර්යාංශය පිහිටුවීම		√	
අරමුදල් සමාලෝචන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම	√		
මූල්‍ය ප්‍රකාශන,වාර්තා නියමිත කාල පරිච්ඡේදය තුල ඉදිරිපත් කිරීම	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
08.සියල්ලන් සදහාම පෝෂිත,සර්වග්‍රාහි හා තිරසරාත්මක ආර්ථික වර්ධනය,පූර්ණ හා ඵලදායී රැකියා සහ සැමට යහපත් ජීවනෝපායක් ප්‍රවර්ධනය කිරීම	තාක්ෂණික වැඩි දියුණු කිරීම් මගින් ඉහළආර්ථික ඵලදායිතාවයක් ලබා ගැනීම	විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය හදුන්වා දීම		√	
-එම-	සංවර්ධනය ඉලක්ක කරගත් රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති දිරිගැන්වීම	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය මූල්‍ය කළමණානරණය සඳහා උපදෙස් හා චක්‍ර ලේක නිකුත් කිරීම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ මූල්‍ය පාලනය සම්බන්ධ මධ්‍යගත කාර්ය භාරයක් ඉටු කරන අතර රාජ්‍ය අංශයේ විනිවිද භාවය වගවීම හා සේවා ලබාදීම වර්ධනය කරන වඩාත් යහපත් වූ රාජ්‍ය මූල්‍ය නියාමන රාමුවක් පවත්වාගෙන යෑමේ වගකීම පවතී. විනිවිද භාවය හා වගවීම ඉලක්ක කර ගන්නා අතර දරිද්‍රතාවය පිටු දැකීම උදෙසා රාජ්‍ය සම්පත් කළමනාකරණය වැඩි කිරීම පිණිස දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වී කටයුතු කරනු ලබයි.

පාර්ලිමේන්තුව වැනි ආයතන වලට රාජ්‍ය වගවීම් පිළිබඳව සහාය වෙමින් නීතියේ පාලනය පිළිබඳව ක්‍රියා මාර්ග ප්‍රවර්ධනය කරමින් තිරසාර සංවර්ධන අභිමථාර්ත සාක්ෂාත් කර ගැනීමට රාජ්‍ය ආයතන වල නීත්‍යානුකූල භාවය හා විශ්වසනීයත්වය ඇති කරවමින් රාජ්‍ය අංශයේ මෙහෙයුම් සිදුවන පූළුල් පාලන පරිසරය ශක්තිමත් කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මෙම වගකීම් මුදුන් පත් කර ගැනීමේදී රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන නියාමනයන් හා රාජ්‍ය මූල්‍ය උපදේශාත්මක සේවාව සපයනු ලබයි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	28	19	09
තෘතීයික	02	02	-
ද්විතියික	30	29	01
ප්‍රාථමික	15	15	-

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

කිසියම් ආයතනයක් සතු මානව සම්පත මනා කළමණාකාරිත්වයක් යටතේ පාලනය කලවිට ආයතනයෙ අරමුණු හා අභිමතාර්තයන් කරාලඟා වීම අපහසු කරුණක් නොවේ.රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමෙ නිලධාරී ඌනතාවය ප්‍රතිපත්ති මට්ටමින් කටයුතු කරන මෙවැනි දෙපාර්තමේන්තුවකට අභියෝගාත්මක කරුණකි.ප්‍රතිපත්ති සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීමේහි දී ජ්‍යෙෂ්ඨ මට්ටමෙ නිලධාරී ඌනතාවය වඩාත් තීව්‍ර ලෙස දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි බලපානු ලබන සාධකයකි.කෙසේ වුවද පවත්නා මානව සම්පත කළමණාකරනය කරගනිමින් දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්තයන් සඵල කරගැනීමෙහිලා උපරිම ප්‍රයත්න දරා ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
Sixth South Asia Region Public Procurement	03	දින 03		US$ 1200	විදේශීය	
Commercial Law Development Program	01	දින 03		US$ 160	විදේශීය	
Land Contracts	01	දින 05		US$ 280	විදේශීය	
Unsolicited Proposal Policy	02	දින 03		US$ 240	විදේශීය	
3rd Senior Executive Training Program For China Exim banks Major Cooperative Partners	01	දින 09	Rs. 117,900	US$ 440 Sterling £ 75	විදේශීය	
Cash Modernization Study Tour	01	දින 05		US$ 200	විදේශීය	
Seminar On China's Development Experience And Its Reform And Opening Up Policies For Sri Lanka	02	දින 30		US$ 2400 Sterling £ 75	විදේශීය	
5th Electronic Government Procurement Conference Of Asia Pacific Public	01	දින 02		US$ 160	විදේශීය	

Electronic Procurement Network						
2019 International Public Procurement Work Shop	01	දින 02		US$ 200	විදේශීය	
2nd Country Visit The Partial Fulfillment Of Diploma In Public Procurement And Contract Administration	01	දින 11		US$ 440 US$ 931 Sterling £ 75	විදේශීය	
Sri Lanka Business Culture Ex Change	01	දින 15		US$ 600 Sterling £ 75	විදේශීය	
Global Procurement Summit	01	දින 03		US$ 160 US$ 200		
Certificate in English for Employment	01	මාස 09	_		දේශීය	
Diploma in English for Junior Executives	01	අවු 01	_		දේශීය	
Advance Certificate in Public Procurement Management	01	මාස 03	_		දේශීය	
Master of Business(Finance)	01	අවු 02	Rs. 312,000		දේශීය	
Certificate in Public Procurement	01	දින 05	_		දේශීය	

Management						
Board of survey-Losses and Write off	01	දින 02	_		දේශීය	
Higher National Diploma in Public Procurement and Contract Administration	01	අවු 02	Rs 120,000		දේශීය	
Certificate in Office Management and Administration	01	දින 05	_		දේශීය	

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

කාර්ය මණ්ඩලයේ දැනුම සහ ධාරිතා සංවර්ධනය මෙන්ම සේවක අභිප්‍රේරණය සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන් මහත් පිටිවහලක් වේ.රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ඍජු සම්බන්ධ විෂයානුබද්ධ මෙන්ම රාජ්‍ය සේවයට පොදු කරුණු සම්බන්ධයෙන් ලබන්නාවූ පුහුණුව සහ අත්දැකීම් දෙපාර්තමෙන්තුවේ කාර්යය සාධනය කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කරනු ලබයි.

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය **(අනුකූල වේ/අනුකූල නොවේ)**	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,	අනුකූල වේ		

	අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති	අනුකූල වේ		

	වෙත ඉදිරිපත් කිරීම			
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාල නොවේ		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුව සෘජුව මහජනයා සමග සම්බන්ධ නොවීම.	ඉදිරියේදි දෙපාර්තමේන්තුව මගින් සිදුකරන කාර්යයන් සඳහා සේවාලාභී ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීම
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	–	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		

20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය.